**ශීර්ෂය 102 - මුදල් අමාත්‍යාංශය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය නොකළ මතය**

මුදල් අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 22 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු සඳහාත් නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) | 2020 වර්ෂය සඳහා සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිම එකතුව රු.මිලියන 7,156.83 ක් වුවද,එයින් රු.මිලියන 2,304.04 ක් පමණක් ඉල්ලුම් කිරීම නිසා එකතුව රු. මිලියන 4,852.79ක් හෙවත් සියයට 68 ක් සැලසුම් කළ අග්‍රිමයට වඩා අඩුවෙන් ඉල්ලුම් කර තිබුණි. | 2020 වර්ෂයේ රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වියදම් අවශ්‍යතාවය මත පමණක් අක් මුදල් ඉල්ලුම් කර ඇති බව |
| (ආ) | සැලසුම් කල පරිදි අදාළ කාර්යයන් ඉටුකිරීම සඳහා 2020 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් එකතුව රු. මිලියන 2,304.04ක් අග්‍රිම වශයෙන් ඉල්ලුම්කර තිබුණද, භාණ්ඩාගාරය විසින් එකතුව රු.මිලියන 1,391.26 ක් පමණක් ලබාදීම නිසා එකතුව රු.මිලියන 912.78 ක් ඉල්ලුම් කල අග්‍රිමයට වඩා අඩුවෙන් ලැබී තිබුණි. | ලබාදුන් අක් මුදල් මත පමණක් වියදම් දරා ඇති බව |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ (SA 92) දක්වා තිබූ එකතුව රු. මිලියන 940.69 ක් වූ බැරකම් වටිනාකම මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වන බව | වර්ෂයට අදාළ සියලුම බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දැක්වීමට කටයුතු කළයුතු වීම. |

## 2.3 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු එකතුව රු5,050,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | නිරීක්ෂණ හා එකඟ වන බව | වාර්ෂික ඇස්තමේන්තු තාත්ත්වික හා ඵලදායි ලෙස සකස් කිරීමේ අවශ්‍යතාවය |
| (ආ) | රාජ්‍ය ආයතන 04 ක් වෙත ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.87,850,000 ක ප්‍රතිපාදන සලසා දී තිබුණද, එම ප්‍රතිපාදන වලින් වර්ෂය අවසාන වනවිට එකතුව රු. 61,293,207 ක් හෙවත් සියයට 70 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | නිරීක්ෂණ හා එකඟ වන බව | -එම- |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට හිඟහිටිව පැවති රජයේ නිලධාරීන්ගේ ණය ශේෂයන් ගෙන් වර්ෂය ඉක්ම වූ ණය ශේෂවල එකතුව රු. 920,110 ක් විය. | අයකර ගැනීමට හැකියාවක් නොමැති ණය මු.රෙ. 113 අනුව අත්හැර දැමීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇති බවත්, එක් නිලධාරියෙකුගේ ණය ගොනුව සොයාගත නොහැකි බවත්, ඉතිරි ණය මුදල් අය කර ගැනීම සඳහා නීති කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව | හිඟ ණය සම්බන්ධව කටයුතු සොයා බලා නොපමාව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම . |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අංශයේ නිලධාරීන් 54 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 04 ඉක්ම වූ ණය ශේෂයන්ගේ එකතුව රු. 3,334,459 ක් විය. | මෙම ණය ශේෂ එවකට පැවති ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අංශයේ තිබූ අත්තිකාරම් ගිණුමට අදාළ වන අතර ඉදිරියේදී මෙම ණය ශේෂ අයවිය යුතු පුද්ගලයින් සේවය කරන සේවා ස්ථාන හඳුනාගෙන අයකර ගැනීමට හෝ එසේ අයකර ගත නොහැකි ණය ශේෂයන් මු.රෙ. 113 (3) ප්‍රකාරව ණය ශේෂ කපා හැරීමට කටයුතු කරන බව | -එම- |

## 2.5 අවිධිමත් ගණුදෙනු

--------------------

හිල්ටන් හෝටලය හා ග්‍රෑන්ඩ් හයිට් කලම්බුහි කොටස් අයිතිය අලෙවි කිරීම සඳහා 2018 ජූලි 17 දින අනුමත කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් පත්කල උපදේශක ප්‍රසම්පාදන කමිටුව විසින් එම්.ටී.අයි. කන්සල්ටින් ඔෆ් බහරේන් ඇන්ඩ් ශ්‍රී ලංකා (MTI Consulting of Bahrain and Sri Lanka) සමඟ අනුබද්ධිත සිංගප්පූරුවේ ලැසර්ඩ් ඒෂියා සමාගම (Lazard Asia) උපදේශකවරු ලෙස තෝරා ගැනීම නිර්දේශ කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂනයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉහත උපදේශක ආයතනය සමග ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2018 සැප්තැම්බර් 27 දින ඇතිකරගන්නා ලද ගිවිසුම ප්‍රකාරව සංධිස්ථාන (Milestone) 04 ක් යටතේ අදාල කාර්යයන් නිමකිරීමට එකඟ වී තිබුණද මෙම කාර්යයන් නිමකළ යුතු දින වකවානු ගිවිසුමේ දක්වා නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වන බව | ගිවිසුම් විධිමත් පරිදි පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) | Lazard Asia ආයතනය හා MTI Consulting ආයතනය විසින් සංධිස්ථාන 02 ක් නිමකොට 2019 මැයි 07 දින ඒ සඳහා පිළිවෙලින් රු. 13,032,986 (USD 68523) ක් හා රු. 4,628,607 ක් වශයෙන් මුදල් අමාත්‍යාංශය වෙත ඉන්වොයිස් ඉදිරිපත් කර තිබුණි. නමුත් මාස 19 කට පසුව එනම් 2020 දෙසැම්බර් 31 දින රු. 17,500,000 ක පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන ඉහත එකතුව වූ රු. 17,661,593 අදාල උපදේශක ආයතන වෙත ගෙවා තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වන බව | ප්‍රතිපාදන නිසි පරිදි සපයාගෙන ව්‍යාපෘති ආරම්භ කිරීමත් නිසි පරිදි ගෙවීම් කිරීමටත් කටයුතු කිරීම |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කෙසේ වුවද ඉහත කාර්යය අතරමඟ නවතා දමා, ඉහත වැයකරන ලද මුදල් නොසලකා ග්‍රෑන්ඩ් හයිට් හෝටලය හා හිල්ටන් හෝටලය සංවර්ධනය කිරීම සඳහා සෙලන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් ආයතනය පිහිටුවා තිබෙන බව නිරීක්ෂණය විය. | එකඟ වී ඇත. | රජයේ ප්‍රතිපත්ති අනුව රාජ්‍ය සම්පත් වලින් රජයට උපරිම වාසි සැලසෙන ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම |

**3. මෙහෙයුම් සමාලෝචනය**
--------------------------

**3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**
--------------------------------

හඳුනාගත් නිරීක්ෂණය පහත පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------------------------- | -------------- |
| අමාත්‍යාංශය යටතේ දේශීය අරමුදල්/ විදේශ ණය යොදවා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 02 ක් සඳහා 2020 වර්ෂයේදී එකතුව රු. 580,100,000 ක ශුද්ධ ප්‍රතිපාදන සලසා තිබුණද, එම ව්‍යාපෘතිවල කාර්යසාධනය මන්දගාමී ස්වරූපයක් ගැනීම හේතුවෙන් එකතුව රු. 472,754,269 ක් හෙවත් සියයට 81 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | නීතිමය සහ ප්‍රායෝගික හේතුන් මත ව්‍යාපෘති අරමුණු ලඟාකර ගැනීම ප්‍රමාද වීම. ප්‍රසම්පාදන කාර්යයන් සිදුකිරීමේ ප්‍රමාදයන්, කාර්ය මණ්ඩල බඳවාගැනීමේ සිදුවූ ප්‍රමාදය, මෙහෙයුම් කටයුතු සිදුකිරීමේ ප්‍රමාදය හා ව්‍යපෘති ආරම්භ නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බව | සැලසුම් කළ ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපාදන, කාර්යක්ෂම ලෙස සම්පත් උපයෝජනය කලයුතු වීම. |

**3.2 වත්කම් කළමනාකරණය**
--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | -------------------------------- | -------------- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මුදල් අමාත්‍යාංශය සතු වාහන 115 ක් පැවතියද, 2020 වර්ෂයට අදාළව වාහන සමීක්ෂණයක් සිදුකොට ඒ පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | හැකි ඉක්මනින් අවසන් වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කරන බව | වාර්ෂිකව වාහන සමීක්ෂණයක් සිදුකොට ඒ පිළිබඳ වාර්තා ඉදිරිපත් කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍යාංශය සතු වාහන 30 ක්, විධිමත් පවරාදීමකින් තොරව වෙනත් ආයතන වෙත ලබාදී තිබුණි. | අදහස් දක්වා නැත. | අදාල වාහන විධිමත් පරිදි පවරාදීමට හෝ නැවත අමාත්‍යාංශය වෙත ලබාගැනීමට හෝ කටයුතු කලයුතු වීම. |
| (ඇ) | විධිමත් පවරාගැනීමකින් තොරව වාහන 10 ක් වෙනත් ආයතන වෙතින් අමාත්‍යාංශය වෙත ලබාගෙන තිබුණි. | අදහස් දක්වා නැත. | අදාල වාහන විධිමත් පරිදි පවරාගැනීමට හෝ නැවත එම ආයතන වෙත ලබාදීමට හෝ කටයුතු කළයුතු වීම. |

**3.3 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බදු අභියාචනා කොමිසම රැස්වන රැස්වීම් ශාලාව තුළ වරකට රැස් විය හැක්කේ එක් කමිටුවකට පමණක් බවත් බදු අභියාචනා පනත ප්‍රකාරව කමිටු 03 ක් පත් කර තිබුණද ඊට අදාළ ගොඩනැඟිලි පහසුකම් නොසැපයීම තුළින් බදු අභියාචනා විසඳීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වා ගැනීමට නොහැකි වී ඇති බවත් ඒ පිළිබඳව සිදුකළ විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. | නව සැලසුමට අනුව රැස්වීම් ශාලා 02 ක් ස්ථාපිත කිරීමට නියමිතය. ඉදිරියේදී එක දිනක කමිටු 3 රැස්විය හැකිවේ යැයි අපේක්ෂා කරන බව. | කමිටු රැස්වීමට පවතින බාධා ඉවත් කිරීමට කටයුතු කිරීම |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට සමස්ථ පුරප්පාඩු 34 ක් එනම් අනුමත සංඛ්‍යාවෙන් සියයට 10 ක් පුරප්පාඩුව පැවති අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 11 ක් වූ අතර එය එහි අනුමත සේවක සංඛ්‍යාව හා සැසඳීමේදී සියයට 33 ක් පමණ විය. | පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් ස්ථාන මාරු කර එවන ලෙස රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර එම අවශ්‍යතා සපුරා ගන්නා තෙක් වැඩ බැලීමේ රාජකාරි ආවරණ පදනම මත නිලධාරීන්ට රාජකාරි පවරා ඇති බැවින් අමාත්‍යාංශයේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑමක් ඇති වී නොමැති බව | කාර්යසාධනයට අහිතකර ලෙස බලපායි නම් එම පුරප්පාඩු පිරවීම හෝ එලෙස බලපෑමක් ඇති නොවේ නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වාර්ෂය අවසානය වන විට මුදල් අමාත්‍යාංශයෙන් වැටුප් ගෙවමින් වෙනත් ආයතනවල සේවය සඳහා නිලධාරීන් 07 දෙනෙකු නිදහස් කර තිබුණි. | ආයතනවල ඉල්ලීම මත නිලධාරීන් මුදාහැර ඇති බව | ආයතනයේ කාර්යයන්ගෙන් බැහැර කාරණා සඳහා සම්පත් යෙදවීම පාලනය කිරීමට කටයුතු කිරීම |